# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 48/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 11/01/2024<br>පැය 1140 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.</u>**

**01. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.01.10 වන දින දහවල් කාලයේදී කිරිබත්ගොඩ පොලිස් වසමේ හුණුපිටිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 ක්, මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 40,000/=ක්** සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කිරිබත්ගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**02. පුරා වස්තු සෙවීමේ අරමුණින් කැණීම් කල සැකකරුවන් පස් දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.01.10 වන දින රාත්‍රි කාලයේ වාලච්චේන පොලිස් වසමේ පොට්ටුකුලම් ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **පුරා වස්තු සෙවීමේ අරමුණින් කැණීම් කල සැකකරුවන් පස් දෙනෙකු කැණීම් කිරීමට උපයෝගි කරගත් උපකරණද සමඟ අත්අඩංගුවට** ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 40,46 සහ 49 වයස් වල පසුවන මාතර. වැලිකන්ද, අම්පාර, මැදිරිගිරිය හා ගිරාදුරුකෝට්ටේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ. වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.01.10 වන දින උදෑසන කාලයේ ඕකේවෙල පොලිස් වසමේ ඉහළ බෙලිගල්ල, බෙලිඅත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඕකේවෙල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වූ ඉහළ බෙලිගල්ල, බෙලිඅත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ඕකේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්මීමන කඳවුර.**

2024.01.09 වන දින දහවල් කාලයේ යක්කලමුල්ල පොලිස් වසමේ මලන්දෙනිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අක්මීමන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන යක්කලමුල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන මලන්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. යක්කලමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.